මගේ අංකය: JSC/SEC/CIR/2022

**සියළුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් සහ අධිකරණ නිලධාරීන් වෙත,**

<u>අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 296 නැවත නිකුත් කිරීම</u>

ශීර්ෂගත කරුණට අදාළව මැතිවරණ කොමසාරිස් ජනරාල් සමන් ශ්‍රී රත්නායක මහතා විසින් මා වෙත යොමු කරන ලද අංක EC/LI/R/court ord/02 හා 2022.06.09 දිනැති ලිපිය හා එම ලිපිය සමග යොමු කරන ලද ඇමුණුම් පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, එම ලිපිය හා ඇමුණුම් ඔබගේ අවධානයට ලක් කරන ලෙසත් අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 296 නැවත නිකුත් කරන ලෙසටත් මට නියම කරන ලදී.

02. ඒ අනුව අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 296 මේ සමඟ නැවත නිකුත් කරමි. (ඇමුණුම-01)

03. තවද 2022.06.09 දිනැති ලිපියේ හා ඇමුණුම් වල පිටපත්ද ඔබගේ අවධානයට ලක් කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2022 ජූලි මස 07 වන දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

ඇමුණුම (01)

අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 296

මගේ අංකය : එස්ජේසී/එම්අයිඑස්සී/04

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
දිසා විනිශ්චයකාරවරුන්,
මහේස්ත්‍රාත්වරුන් සහ
ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරුන් වෙත,

## ඡන්දහිමි බලය.

1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 2 වන වගන්තිය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාවෙහි සඳහන් නුසුදුසුකම්වලින් කිසිවකට යමෙක් යටත් වන්නේ නම් ඡන්දහිමියකු වශයෙන් ලියාපදිංචි කරවා ගැනීමට, එම අය නුසුදුසු වේ.

02. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89(ඇ) වගන්තිය මෙසේය.

" (ඇ) යම්කිසි තැනැත්තෙක් සිහිවිකල තැනැත්තකු ලෙස ශ්‍රී ලංකාවේ බලපවත්නා යම්කිසි නීතියක් යටතේ තීරණය කරනු ලැබ සිටී නම් හෝ විනිශ්චය කරනු ලැබ සිටී නම් හෝ ඒ තැනැත්තා ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමක දී හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයක දී හෝ ඡන්ද හිමියකු වීමට හෝ ජනමත විචාරණයක දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

(ඈ) යම්කිසි තැනැත්තෙක් අවුරුදු දෙකකට නොඅඩු කාලයක් බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදකට කවර වූ හෝ අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමෙන් පසුව නියම කරන ලද හය මාසයකට නොඅඩු කාලයකට කවර වූ හෝ ආකාරයක බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් නැතහොත් ගත වූ සත් අවුරුදු කාලය තුළ ඒ දඬුවම සම්පූර්ණයෙන් ම විඳ සිටියේ නම් නැතහොත් මරණීය දණ්ඩනයට යටත් ව සිටී නම් නැතහොත් එවැනි දණ්ඩන නියමයක් ක්‍රියාවේ යෙදවීම වෙනුවට හය මාසයකට නොඅඩු කාලයකට බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් නැතහොත් ගත වූ සත් අවුරුදු කාලය තුළ ඒ දඬුවම සම්පූර්ණයෙන් විඳ සිටියේ නම් ඒ තැනැත්තා ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමක දී හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයකදී හෝ ඡන්ද හිමියකු වීමට හෝ ජනමතවිචාරණයකදී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

එසේ වුව ද මේ ඡේදය යටතේ නුසුදුස්සකු වූ කවර වූ හෝ තැනැත්තකුට කොන්දේසි රහිත සමාවක් දෙන ලද්දේ නම් ඒ සමාව දුන් දිනයේ සිට ඒ නුසුදුසුකම නැති වී යන්නේ ය. "

03. මෙම ව්‍යවස්ථාපිත නියමය ක්‍රියාත්මක කිරීමට පහත සඳහන් හේතු මත අසීරු වී ඇති බව මැතිවරණ කොමසාරිස්වරයා පෙන්වා දී ඇත.

I. සිර දඬුවම් ලබා ඇති බවට හෝ එබඳු දඬුවමකට යටත්ව සිටින පුද්ගලයකු එසේ යටත්ව ඇති බවට ලිඛිත සාක්ෂියක් නොවීම.

II. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89(ඇ) වන වගන්තියට අනුව පුද්ගලයා විඳින හෝ විඳිමින් සිටින සිර දඬුවම මාස 06 කට වඩා දීර්ඝ වුවත් එය පනවා ඇත්තේ (ගැටළුව වන්නේ මාස 06 සිට අවුරුදු 02 දක්වා) වසර දෙකක් දක්වා දඬුවමක් දිය හැකි වරදකටද යන්න දැන ගැනීමට ක්‍රමයක් නොමැති වීම.

04. එසේ හෙයින් මැතිවරණ කොමසාරිස්වරයාහට යථෝක්ත ව්‍යවස්ථාපිත නියමය ක්‍රියාත්මක කිරීම සඳහා අදාල වන්නා වූ තොරතුරු ඔබ අධිකරණයන් මගින් ලබාදීම සුදුසු බවට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

05. ඒ අනුව ඔබ අධිකරණ මගින් පනවනු ලබන ඉහත සඳහන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89(ඇ) වගන්තිය යටතට ගැනෙන දඬුවම් ලබන පුද්ගලයන් සම්බන්ධයෙන් විස්තර මේ සමග අමුණා ඇති ආකෘතිය මත මැතිවරණ කොමසාරිස්වරයාට ලබාදීමට කටයුතු කරන්න.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

පී. ඩබ්. ඩී. සී. ජයතිලක
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

2005 සැප්තැම්බර් මස 07 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.

ඇමුණුම 02

# සිරදඬුවම් විඳින පුද්ගලයන්ගේ තොරතුරු වාර්තා කිරීම

අධිකරණය : ........................

| නඩු අංකය | වූදිතයාගේ නම සහ ලිපිනය | වූදිතයාගේ ජාතික හැඳුනුම්පත් අංකය | වරදකරු කිරීමට අදාල වගන්තිය | වරදකරු වූ දඬුවමට නීතියෙන් නියමිත දඬුවම | පනවන ලද දඬුවම හා ගෙවී යන ආකාරය | දඬුවම ක්‍රියාත්මක කිරීම ආරම්භ වන දිනය හා දඩ, වන්දි මුදල් ගෙවා ඇත් ද යන වග |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு

ANNEXE A.

පොදු කාර්යාලය :011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
General Office

ෆැක්ස්/தொலைநகல்/Fax:011-2868426
Web: www.elections.gov.lk e-mail: info@slelections.gov.lk

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය(10107)

தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய(10107)

මගේ අංකය: EC/LI/R/court ord/02
எனது இல. :

ඔබේ අංකය:
உமது இல.:

දිනය:2022.06.[illegible]
திகதி :

JUDICIAL SERVICE COMMISSION SECRETARIAT
20 JUN 2022

ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව,
කොළඹ 12.

ලේකම්තුමනි,

**<u>ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89(ඇ) ව්‍යවස්ථාව ප්‍රකාර ඡන්ද බලය සඳහා නුසුදුසු වීම</u>**

2005 සැප්තැම්බර් මස 07 දින අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් සියළුම අධිකරණ විනිශ්චයකාරවරුන්, දිසා විනිශ්චයකාරවරුන්, මහේස්ත්‍රාත්වරුන් හා ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරුන් වෙත යොමු කරන ලද අංක: එස්ජ්සී/එම්අයිඑස්සී/04 හා 2005.09.07 දිනැති ලිපිය වෙත ඔබගේ කාරුණික අවධානය යොමු කරමි. ඔබගේ පහසුව සඳහා එකී ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා ඉදිරිපත් කරමි.

02. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89(ඇ) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව සිර දඩුවම් ලබන තැනැත්තන් සම්බන්ධ විස්තර මැතිවරණ කොමිෂන් සභාව වෙත ලබා දීමට කටයුතු කරන ලෙස ඉහත ලිපිය මඟින් දැනුම් දී ඇත. එසේ සිර දඩුවම් නියම කරන ලද තැනැත්තන් පිළිබඳ තොරතුරු සමහර අධිකරණ විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත නිරතුරුවම දැනුම් දෙනු ලබන අතර, බොහෝ අධිකරණ විසින් ඒ පිළිබඳව කිසිඳු දැනුම් දීමක් කර නොමැති බව නිරීක්ෂණය වී ඇත. ඒ අනුව අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ සිරදඬුවම් පමුණුවා ඇති ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට නුසුදුසු පුද්ගලයන් පවා ඡන්ද අයිතිය භුක්ති විඳීම ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන හා මැතිවරණ නීතිය ද උල්ලංඝනය කිරීමක් වේ. එම තැනැත්තන් පිළිබඳව නීත්‍යානුකූලව කටයුතු කිරීමට අවශ්‍ය තොරතුරු නොමැති වීම තුළින් මෙලෙස දඬුවම් විඳීම නිසා ඡන්ද බලය අහිමි විය යුතු තැනැත්තන්ට පවා පළාත් පාලන ආයතන, පළාත් සභා මැතිවරණ සඳහා තරඟ කිරීමට ද අවස්ථාව ලැබීම තුළින් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමකට අගතියක් වනවා මෙන්ම නුසුදුසු තැනැත්තන්ට මහජන නියෝජිතත්වය ලබා ගැනීමට හැකියාවක් ද ලැබේ.

03. මෙම කරුණ පිළිබඳව ඔබගේ සුවිශේෂ අවධානය යොමු කොට සිර දඬුවම් විඳින තැනැත්තන්ගේ තොරතුරු මේ සමඟ අමුණා ඇති ඇමුණුමට අනුකූලව සකස් කොට විධිමත් පරිදි මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙසට සියළුම ගරු විනිසුරුවරුන් දැනුවත් කිරීමට පියවර ගනු ඇතැයි කාරුණිකව අපේක්ෂා කරමි.

04. මේ පිළිබඳව ඔබ විසින් දක්වන සහයෝගය ඉතා අගය කොට සළකමි.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

සභාපති
தவிசாளர்
දුරකථන/தொலைபேசி: 011-2868444
ෆැක්ස්/தொலைநகல் :011-2868445
E-mail: comelesl@sltnet.lk

ලේකම්
செயலாளர்
දුරකථන/தொலைபேசி: 011-2868406
ෆැක්ස්/தொலைநகல் :011-2868406
E-mail:admin@slelections.gov.lk

මැතිවරණ කොමසාරිස් ජනරාල්
දුරකථන/தொலைபேசி:011-2885207
ෆැක්ස්/தொலைநகல் :011-2885208
e-mail: cgelection@elections.gov.lk

මගේ අංකය :- JSC/SEC/CIR/2018

අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 296 නැවත නිකුත් කිරීම

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් සහ

අධිකරණ නිලධාරීන් වෙත,

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 (ඇ) ව්‍යවස්ථාව ප්‍රකාර

ඡන්ද බලය සඳහා නුසුදුසු වීම

ශීර්ෂගත කරුණ සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස් ජනරාල්/අධ්‍යක්ෂ ජනරාල් ආර්.එම්.ඒ.එල්.රත්නායක මහතා විසින් මා වෙත එවන ලද 2018.08.04 දිනැති ලිපිය පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 296 නැවත නිකුත් කරන ලෙසත් ඒ අනුව කටයුතු කරන ලෙසත් ඔබට දැන්වීමට මට නියම කර ඇත.

අදාල චක්‍රලේඛයේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.

එච්.එස්.සෝමරත්න

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව

O/C

2018 සැප්තැම්බර් මස 13 වෙනි දින,

කොළඹ 12,

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

පිටපත : ආර්.එම්.ඒ.එල්.රත්නායක මහතා, මැතිවරණ කොමසාරිස් ජනරාල්/අධ්‍යක්ෂ ජනරාල්, මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය, සරණ මාවත, රාජගිරිය } දැ.ගැ.පි.